# සාමාන්‍ය සමයේ විසිහයවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ජෝනා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෝනා 3 : 1-10

"නිනිවයේ වැසියෝ නපුරු මාර්ගයෙන් ඉවත් වූ විට සමිඳාණෝ ඔවුන්ට කරුණා කළ සේක."

සමිඳාණන් වහන්සේගේ පණිවුඩය දෙවන වරට ජෝනා වෙත පැමිණියේ ය. "නුඹ නැගිට නිනිවය නම් ශ්‍රේෂ්ඨ නගරයට ගොස් මා නුඹට කියන පණිවුඩය එහි ප්‍රකාශ කරන්නැ"යි සමිඳාණන් වහන්සේ වදාළ සේක. එවිට ජෝනා නැගිට සමිඳාණන් වහන්සේ නියම කළ පරිදි නිනිවයට ගියේ ය.

නිනිවය ඉතා විශාල නගරයකි. එය හරහා යාමට දවස් තුනක් ගතවේ. ජෝනා එක දවසක් ගමන් කර නගරයට ඇතුල් වී, "තව දින සතළිසක් නිනිවය වැනසෙනු ඇතැ"යි මොරගසා ප්‍රකාශ කළේය."

නිනිවයේ වැසියෝ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කර උපවාසයක් නියම කොට, ලොකු අය පටන් කුඩා අය දක්වා දළ රෙදි ඇඳ ගත්තෝ ය. ඒ ආරංචිය නිනිවයේ රජු වෙත පැමිණි විට, ඔහු සිංහාසනයෙන් බැස තම සළුව ඉවත ලා දළ රෙදි පොරවා ගෙන අළු පිට හිඳ ගත්තේය. එවිට ඔහු නිනිවය පුරා නියෝගයක් පළ කළේය. ඒ මෙසේය.

“මාගේ සහ මාගේ උත්තමයන්ගේ නියෝගය පරිදි මිනිසෙක් වත්, මෘගයෙක් වත්, ගවයෙක් වත්, බැටළුවෙක් වත් කිසිම දෙයක රස නොබලත්වා. කිසි කෑමක් නොකත්වා. වතුර නොබොත්වා. මනුෂ්‍යයෝ ද මෘගයෝ ද දළ රෙදි පොරවාගෙන දෙවියන් වහන්සේට බලවත් සේ මොර ගසත්වා! ඔව්හු එකිනෙකා තම තමාගේ නපුරු මාර්ගයෙන් ද තමන්ට ඇබ්බැහි දාමරිකකම්වලින් ද හැරෙත්වා! අප විනාශ නොවන පිණිස සමහර විට දෙවියන් වහන්සේ හැරී තමන් සිත වෙනස් කරගෙන තමන්ගේ බලවත් උදහසින් දුරු වන්නට බැරි නැත. “දෙවියන් වහන්සේ ඔවුන් කළ දේත්, ඔවුන් නපුරු මාර්ගයෙන් ඉවත් වූ අයුරුත් දැක, ඔවුන්ට කරන්නට අදහස් කළ විපත ගැන සිත වෙනස් කරගෙන එය නොකළ සේක.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 130 : 1-4, 7-8

පිළිතුර: සමිඳුනි, අපගේ අයුතුකම් ඉවතලුව මැනව.

ගීය:

සමිඳුනි, දුක් සයුරේ සිට මම ඔබට මොර ගසමි.
සමිඳුනි, මාගේ හඬට සවන් දුන මැනව. මාගේ කන්නලව්වට ඔබේ කන් යොමු කළ මැනව.

සමිඳුනි, ඔබ අපේ අයුතුකම් සටහන් කර තබන සේක් නම්, විනිශ්චයයෙන් බේරෙන්නට පුළුවන් කවරෙකුට ද?

එහෙත්, ඔබ කෙරෙහි ගරු බියෙන් සිටින පිණිස ඔබ අපට කමාව දෙන සේක.

එම්බා ඉශ්රායෙල් ජනයෙනි, සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න. මන්ද, සමිඳුන්ගේ ප්‍රේමය තිරසර ය. ගැලවීම මුළුමනින් ම එතුමන් අතෙහි ය.
එතුමාණෝ ඉශ්රායෙල් ජනයා ඔවුන්ගේ පාප සියල්ලෙන් මුදා හරින සේක.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මාගේ මිතුරෝ ය.
මන්ද, මාගේ පියාණන් වහන්සේගෙන් මා ඇසූ සියල්ලම ඔබට දන්වා වදාළ බැවිනි"ය යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"දෙවියන් වහන්සේගේ වචනය අසා එය පිළිපදින්නෝ භාග්‍යවන්තයෝ ය"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 10: 38–42

“මාර්තා සිය නිවසෙහි කටයුතුවල යෙදුනා ය. එහෙත් මරියා යහපත් දෙය තෝරා ගත්තාය.”

තවද, ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් සමග යද්දී, උන්වහන්සේ එක් ගමකට ඇතුල් වූ සේක. එවිට මාර්තා නම් එක් ස්ත්‍රියක් සිය නිවසට උන්වහන්සේ පිළිගත්තාය. ඇයට මරියා නම් සහෝදරියක් වූවා ය. ඇ ස්වාමින් වහන්සේගේ පාමුල හිඳ උන්වහන්සේගේ ඉගැන්වීමට සවන් දුන්නාය. එහෙත් මාර්තා සත්කාර කටයුතු වැඩි වීමෙන් කරදර වී සිටියාය. ඇ උන්වහන්සේ වෙතට පැමිණ, “ස්වාමිනි මාගේ සහෝදරිය පැත්තකට වී සත්කාර කටයුතු මා පිටම පවරා සිටින හැටි ඔබ සලකන්නේ නැද්ද? එබැවින් මට උදව් කරන්නට ඇට කිව මැනවැ”යි කීවාය. එහෙත් ස්වාමින් වහන්සේ උත්තර දෙමින් “මාර්තා, මාර්තා ඔබ බොහෝ දේ ගැන කරදර වෙමින් නලංගු වන්නෙහි ය. එහෙත් අවශ්‍ය එක දෙයකි. මරියා යහපත් දෙය තෝරා ගෙන ඇත. එය ඇ කෙරෙන් පැහැර ගනු නොලැබේ ය”යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.